වැඩ බැරි දූස ගැන කතා

11

නිකොලායි නෝසව්



# මී පැණි පැලැස්තරය



KANOL PUBLISHING HOUSE (PVT) LTD.

## වැඩ බැරි දූස ගැන කතා

## නිකොලායි නෝසව්

11

# මී පැණි පැලැස්තරය


අනුවාදය - දැදිගම වී. රුද්රිගු

චිත්‍ර - බරිස් කලෞෂින්

පරිගණක සැලසුම - මාලක ලලනජීව



මුද්‍රණය 2024





KANOL
PUBLISHING HOUSE (PVT) LTD.





වැඩ බැරි දාස අවදි වෙලා වටපිට බැලුවා. එයා අලුත් තැනෙක නිදා ගෙන හිටිය බව තේරුම් ගත්තා. එයාගේ ඇඳේ මෙට්ට ඇතුළට දාලා තිබුණේ කුකුළු පිහාටු. ඒවා බොහොම සිනිඳුයි. හරියට නටු නැති ඩැන්ඩේලියන් මල්වලින් කොට්ට, මෙට්ට පුරවලා වගෙයි. කවුදෝ කතා කරන්නට පටන් ගත්ත නිසා වැඩ බැරි දාස නින්දෙන් අවදි වුණා. ඔහු ඇස් ඇරලා වට පිට බලන විට තේරුම් ගත්තා මෙය ඔහුට නොපුරුදු, තමාට අයිති නැති අලුත් නිදන කාමරයක් බව. එහි මුලුවල පුංචි පුටු තිබුණා. බිත්තිවල පලස් එල්ලලා. නොයෙක් පාටැති ලස්සන මල් වර්ග ඒ පලස්වලින් පෙනෙයි. ජනේලය අසල තනි කකුලේ කුඩා රවුම් මේසයක් තිබුණා. ඒ මේසය උඩ නොයෙක් පාටැති නූල් වර්ග සහ පුංචි කොට්ටයකි. ඒ කොට්ටයට ඉඳිකටු සහ අල්පෙනෙති ඇනලා. ඒ කොට්ට පොඩිත්ත ඉත්තෑවෙකුට සමානයි. තරමක් ඈතින් කඩදාසි ආදිය සහිත ලියන මේසයකි. මේසය ළඟින් පොත් අල්මාරියකි. දොර අසල බිත්තියේ මූණ බලන විශාල කණ්ණාඩියකි.



එය ඉදිරිපිට කුරුම්ට් පැංචියන් දෙදෙනෙක් කතා කරමින් ඉන්නවා. එක්කෙනෙක් ඇඳලා හිටියේ දිලිසෙන, නිල් පාට සේද ගවුමක්. බඳ පටියත් නිල් පාටයි, පිටු පසින් එය මලක් හැඩයට ගැට ගහලා තිබුණා. ඒ ගෑනු ළමයා ගේ ඇස් නිල් පාටයි, හිසකේ කළු පාටයි. අනික් ළමයා රෝස පාට සහ දම් පාට මල් වැටිච්ච ගවුමක් ඇඳලා. බඳ පටියත් ඒ පාට ම ය. පිටු පස මලක් හැඩයට ගැට ගහලා. එයාගේ හිසකේ සුදු පාටට හුරු රන්වන් පාටයි. ඒවා දෙවුර වැසෙන සේ විහිදිලා. එයා කණ්ණාඩිය ඉදිරිපිට සිට ගෙන තොප්පියක් හිස දමාගෙන සිටි අතර කිචිබිචි ගගා කතා කරනවා.

"අපොයි, බොහොම නරක තොප්පියක්! කොහොම දැම්මත් සුදුසු නැහැ. පළල් වාටියක් ඇති තොප්පියක් මහන්නට මට ඕන වුණා. නමුත් රෙදි මදි වුණා. ඒ හන්දා වාටිය හීන් කරන්නට සිද්ද වුණා. වාටිය හීන් වුණාම මගේ මූණ වටකුරුවට පේනවා. එය බොහොම අවලස්සනයි."

"ඇති ඇති! ඔයා කණ්ණාඩිය ඉදිරිපිට දැගලුවා. කණ්ණාඩිය ඉදිරිපිට දඟලන විට මට ඉවසා ගෙන ඉන්ට බැහැ"යි නිල්වන් ඇස් ඇති ළමයා කීවා.

"ඔයා සිතන හැටියට මුහුණ බලන කණ්ණාඩිය තියෙන්නෙ මොකටද?" එහෙම ඇසුවා රන්වන් පාට හිස කේ ඇති ගෑනු ළමයා.





හිසේ පසු පස කොටස වැසෙන සේ තොප්පිය හිස ලා ගත් ඒ ළමයා දෙනෙත් හකුළුවා ගත්තා.

වැඩ බැරි දාසට හිනා යන්නත් එනවා. හිනාව අමාරුවෙන් නවත්වා ගෙන ඔහු නහයෙන් හඬක් පිට කළා. රන්වන් හිස කේ ඇති ළමයා වහාම ඇඳ ළඟට ඇවිල්ලා සැක සිතින් වැඩ බැරි දාස දෙස බලන්නට පටන් ගත්තා.

එහෙත්, වැඩ බැරි දාස නිදිමත ගතියක් මවා පාලා ඇස් වසා ගත්තා. කුරුළු පැංචියන් දෙදෙනා සපත්තු අඩිවලින් හඬ පිට නොකර ඇඳ ළඟට ඇවිත් හිට ගත්තා.

"මේ කොල්ලා මොනවාදෝ කීවා වගෙයි, මට ඇසුණේ," එක ළමයෙක් කියන හැටි වැඩ බැරි දාසට ඇහුණා. "මට එය නිකම් ඇහුණා වෙන්නට ඕන.... මේ කොල්ලා නැගිටින්නේ කවදාටද? ඊයේ ඉඳලා එයා සිහි නැතිව වැතිර ඉන්නවා"

අනෙක් ගෑනු ළමයා මෙහෙම පිළිතුරු දුන්නා.

"මී පැණි නෝනා කීවා එයාව නැගිට්ටුවන්නට එපයි කියලා. එයා නැගිට්ටාම මී පැණි නෝනාට දන්වන්න කියලා මට කියලා තියෙනවා."

"මී පැණි නෝනා කියන්නේ කාටද?" බොරු නින්දේ පසුවන වැඩ බැරි දාස කල්පනා කළා.

"හරිම නිර්භය කොල්ලෙක්! බලන්නකෝ එයා අහසේ පාවෙන බැලුමක නැගලා ගියා නෙව!" කුරු පැංචියන් දෙදෙනා කුසු කුසු ගාන හැටි ඇසුණා.

තමාට නිර්භය කොල්ලා කියලා හඳුන්වන හැටි ඇසිලා වැඩ බැරි දාසගේ කට දෙපැත්තට පළල් වුණා. එහෙත් හිනා නොවී සිටීමට ඔහු සමත් වුණා.

"ඔහු නැගිට්ටාට පසුව මම ඔහු හමුවෙන්නම්. අහසේ පාවෙන බැලුම ගැන විස්තර දැන ගැනීමට මා කැමතියි. නමුත් එයාගේ මොළය දෙදරුම් කාලා තිබුණොත්!"

"මොන බොරුද! මගේ මොළය දෙදරුම් කාලා නැහැ!"යි වැඩ බැරි දාස සිතුවා මිසක් කීවේ නැහැ.

රන්වන් හිස කේ ඇත්තිය කාමරයෙන් පිට වී ගියා. කාමරයේ නිහඬතාවකි. වැඩ බැරි දාස දෙනෙත් වසා ගෙන බොරු නින්දේ පසු වුණාට එයාගේ දෙකන් අවට ශබ්ද ගැන සෝදිසියෙන් තිබුණා. අන්තිමේ දී ඔහු එක් ඇසක් හැර බලන විට නිල් ඇස් ඇති ගෑනු ළමයා ඔහු දෙසට නැවී බලන සැටි දුටුවා. ඒ ළමයා ආචාරශීලී ලෙස මඳ සිනා පා පසු ව මුහුණ ඇඹුල් කර ගෙන දබරඟිල්ල දික් කරලා මෙසේ ඇසුවා.

"ඔයා හැමදාම අවදි වෙන්නේ ඔහොමද? ඉස්සෙල්ලා එක ඇහැක් ඇරලා ඉන් පසුව අනික් ඇහැ අරිනවා නේද?"

වැඩ බැරි දාස හිස වනලා අනික් ඇහැත් හැර බැලුවා.

"එහෙනම් ඔයා නිදා ගෙන හිටියේ නැත්ද?"

"නැහැ, මම අවදි වුණේ මේ දැනුයි."



වැඩ බැරි දාස තවත් මොනවාදෝ කියන්නට කට ඇරියා විතරයි, ගෑනු ළමයා ඔහුගේ කට ඇඟිල්ලකින් වැහුවා.

"නිහඬ වනු! කතා නොකරනු! කතා කිරීම ඔයාට හොඳ නැත. ඔයාට බරපතළ රෝගයක් හැදිලා!"

"මට ඇති ලෙඩක් නැහැ!"

"ඔයා දන්නෙ කොහොමද? ඔයා දොස්තර කෙනෙක්ද?"

"නැහැ!"

"ඉතින් එහෙනම් ඔයා දන්නෙ කොහොමද? මම දොස්තර කැඳවන තුරු ඔයා ඇඳේ වැතිර සිටිය යුතුයි. ඔයාගේ නම මොකක්ද?"

"වැඩ බැරි දාස. ඔයාගේ නම?"

"මගෙ නම නිල්මිණි"

"ලස්සන නමක්" වැඩ බැරි දාස කීවා.

"ඔයා මගේ නමට කැමති වීම නිසා මම සතුටු වෙනවා. ඔයා හොඳ ගති ඇති ළමයෙක් බව පෙනෙනවා."යැයි නිල්මිණි කීවා.

වැඩ බැරි දාස ගේ මුහුණේ හිනාවක් මැවුණා. ඔහුට හොඳ කීම නිසා ඔහු බොහොම සතුටු වුණා. මීට පෙර කිසිම කෙනෙක් වැඩ බැරි දාසට හොඳක් කියලා නැහැ. හැම දෙනා ම එයාට බැණ වැදුණා විතරයි. ඒ නිසා





තමයි ඔහුට එම සතුට ඇති වුණේ. වැඩ බැරි දාස ගෑනු ළමයකු එක්ක කතා කරනවා කියලා අනික් අය දැන ගතහොත් ඔහුට සරදම් කරන නිසා ඔහු බිය වුණු නමුදු, අහල පහල කොල්ලන් නැති හන්දා ඔහු නිල්මිණි සමග නිදහස් ලෙස සහ ආචාරශීලී ලෙස කතා කළා.

"අර අනික් ළමයාගේ නම මොකක්ද?"

"මොන ළමයාගේද?"

"ඔයාත් එක්ක කතා කරපු අර ලස්සන ගෑනු ළමයා"

"අහා! එහෙනම් ඔයා බොහෝ වේලාවක් තිස්සේ නිදාගෙන හිටියේ නැහැ නේද?" නිල්මිණි ඇහුවා.

"නැහැ, මට විනාඩියකට ඇහැරුණා. ආයෙමත් මම හණිකට නිදා ගත්තා."

"ඒ කතාව ඇත්ත නොවේ, බොරුවක්!" නිල්මිණි හිස වනා කියමින් බැම හකුළුවා ගත්තා. "එහෙනම් ඔයා කියන්නෙ මම එතරම් ලස්සන නැහැ කියලද?"

"මම එහෙම කීවේ නැහැ! ඔය ළමයත් ලස්සනයි" වැඩ බැරි දාස බය වී පිළිතුරු දුන්නා.

"අපි දෙදෙනාගෙන් වැඩියෙ ලස්සන කවුද? මම ද, එයාද?"

"ඔයා.... අරයාත් ලස්සනයි. ඔය ළමයින් දෙදෙනාම ලස්සනයි"

"ඔයා පල් බොරුකාරයෙක්. නමුත්, මම ඔයාට සමාව දෙනවා. ඔයා ලස්සනයි කියන කෙල්ලගෙ නම හිමවතී. ඒ කෙල්ලව ඔයාට මතුවටත් හමු වේවි. ඉතින් දැනට ඔය ඇති. වැඩියෙ කතා කිරීම ඔයාට අගුණයි. සන්සුන් ලෙස වැතිර ඉන්න. ඇඳෙන් නැගිටීම තහනම්. මම දැන් මී පැණි නෝනාට අඬ ගහන්නම්!" නිල්මිණි කීවා.

"මී පැණි නෝනා කියන්නෙ කාටද?"

"මී පැණි තමයි අපේ දොස්තර නෝනා. ඔයාට බෙහෙත් කරන්නෙ එයා."

නිල්මිණි කාමරයෙන් පිට වී ගිය විගස වැඩ බැරි දාස ඇඳෙන් නැගිටලා එයා ගේ ඇඳුම් සොයන්නට පටන් ගත්තා. දොස්තරලා ළමයින්ට එඬරු තෙල් බෙහෙත් පොවන බවත්, තුවාලවලට අයඩින් ගාන බවත් දැන සිටි වැඩ බැරි දාස මෙතැනින් හණිකට පැනලා යන්නට කල්පනා කළා. අයඩින් ගාපුවාම ඇඟ දනවා. ඔහුගේ ඇඳුම් සොයා ගන්නට නැහැ. පුංචි බංකුවක වාඩි වෙලා පිට බිත්තියට හේත්තු කරගෙන ඉන්න බෝනික්කෙකුව ඔහු දුටුවේ මේ වෙලාවේදීය.

ඒ බෝනික්කාව කඩා බිඳ දමලා එයා ගේ ඇඟට පුරවා තිබෙන්නේ පුලුන්ද, නැතිනම් ලී කුඩුද කියන එක දැන ගැනීමට ඔහුට ඕන වුණා. ඔහුගේ ඇඳුම් ගැන අමතක වෙලා ඔහු පිහියක් සෙවීමට පටන් ගත්තා. එවිට මුහුණ බලන කණ්ණාඩියෙන් තමාගේ රූපය පෙනෙන හැටි වැඩ බැරි දාස දුටුවා. බෝනික්කාව බිම දමලා ඔහු කණ්ණාඩිය ඉදිරිපිට සිටගෙන විරිත්තමින් මූණ දෙස බැලුවා. හොඳ හැටි බලා ඔහු මෙහෙම කියාපි.

"මාත් ලස්සනයි නෙව. මගෙ මුහුණ ඉතා වටකුරු නොවැ"

දොරට එහා අඩි ශබ්දය ඇසුණෙන් වැඩ බැරි දාස වහා ම ඇඳට පැන වැතිර ගෙන පොරෝනයෙන් ඇගත්, මුහුණත් වසා ගත්තේය.

නිල්මිණි සමග තවත් ගැහැනු ළමයෙක් කාමරයට ඇතුළු වුණා. එයා සුදු ලෝගුවක් ඇඳලා පුංචි සුදු තොප්පියක් හිස දමාගෙන හිටියා. දුඹුරු පාට පුංචි බෑග් එකක් එයාගේ අතේ තිබුණා. ඇගේ දෙකම්මුල් රෝස පාටයි, පිම්බිලා. දෙනෙත් අළු පාටයි. කණ්ණාඩි කුට්ටමක් දමාගෙන එයා බැරෑරුම් ලෙස බලනවා. නිල්මිණි මතක් කළ මී පැණි නෝනා මෙයා විය යුතු යැයි වැඩ බැරි දාස සිතුවා.

මී පැණි නෝනා ඇඳ ළඟට පුටුව ඇද ගෙන එය මත බෑග් එක තියලා හිස වනලා මෙහෙම කීවා.



"අපොයි, මේ කොල්ලන්ගේ හැටි! ඒගොල්ල හැමදාම මොකක් හරි දඟකාර වැඩක් හොයා ගන්නවා! කරුණාකරලා කියන්න, ඔය ගොල්ල අර බැලුම් බෝලෙ නැගලා ගියේ මොකටද? කට වහනු! නිශ්ශබ්ද වනු! මීට පසුව නොකරන බවට පොරොන්දු වීමට හදන බව මම දන්නවා. කොල්ලන් හැමදාම කියන්නේ ඔහොම තමයි. නමුත් හැමදාම දඟ කරනවා"



මී පැණි නෝනා බෑග් පොඩිත්ත හැරිය විටම කාමරය පුරා අයඩින්, නැතිනම් වෙනත් බෙහෙත් සුවඳක් පැතිර ගියා. වැඩ බැරි දාස බිය වුණා. මී පැණි නෝනා ඔහු දෙසට හැරී අණ කළා.

"රෝගියා නැගිටිනු"

වැඩ බැරි දාස ඇඳෙන් නැගිටින්නට පටන් ගත්තා.

"රෝගියා නොනැගිටිනු! මම කීවේ ඇඳේ වාඩි වෙන්න කියලා විතරයි," මී පැණි නෝනා සැරෙන් කීවා.

ඔහු දෙවුර සොලවා ඇඳ උඩ වාඩි වුණා.

"රෝගියා, දෙවුර සොලවන්න එපා" මී පැණි නෝනා සැරවුණා. "දිව පෙන්වනු"

"මොකටද?"

"පෙන්වනු, පෙන්වනු. දිව බලන්නට ඕන"

වැඩ බැරි දාස දිව දිගු කළා.

"'ආ' කියලා කියනවා"

"ආ-ආ-ආ" ඔහු දිව ඇද හඬ නැගුවා.

මී පැණි නෝනා බෑග් පොඩ්ඩ්තෙන් ලී නළාවක් ගෙන එය රෝගියාගේ පපුවට තබා අණ කළා.

"දීර්ඝ ලෙස හුස්ම ගනු!"

වැඩ බැරි දාස දුම්රියක් වගේ හඬ නගා හුස්ම ගත්තා.

"හුස්ම ගැනීම නවත්වනු."

"හා-හා-හා!" හිනා වෙමින් ඔහු සෙලවෙන්නට වුණා.

"රෝගියා සිනා වන්නේ මන්ද? හිනා වීමට තරම් කිසිවක් මා කීවේ නැහැ!"

"හුස්ම නොගෙන මා ජීවත් වන්නේ කොහොමද?" දිගටම හිනා වෙමින් ඔහු ඇසුවා.

"හුස්ම නොගෙන ජීවත් වීමට බැරි බව ඇත්ත. නමුත්, මොහොතකට හුස්ම නොගෙන ඉන්නටයි මා කීවේ."

"ඒක පුළුවනි" ඊට එකඟ වුණු වැඩ බැරි දාස හුස්ම නොගෙන හිටියා.



ලෙඩාව බැලූ පසු මී පැණි නෝනා මේසය ළඟට වෙලා බෙහෙත් තුණ්ඩුවක් ලියන්නට පටන් ගත්තා.

"මේ රෝගියාගේ පිටේ තැල්මක් තියෙනවා. ඔයා බෙහෙත් ශාලාවට ගිහිල්ලා මේ තුණ්ඩුව පෙන්නලා මී පැණි පැලැස්තරයක් ගන්න. එයින් කෑල්ලක් මේ රෝගියාගේ පිටට අලවන්න. ඔහුට ඇඳෙන් නැගිටීම තහනම්. ඔහු නැගිට්ටොත් කිසිවකුට පහර දීලා, කිසිවකුගේ නළල තුවාල කරාවි. කොල්ලන් ගැන පරෙස්සමින් ක්‍රියා කළ යුතුය."

මී පැණි නෝනා ලී නළාව බෑගය තුළ දමා ගෙන වැඩ බැරි දාස දෙස රවා බලා කාමරයෙන් පිට වී ගියා.

බෙහෙත් තුණ්ඩුව අතට ගත් නිල්මිණි මෙසේ කීවා:

"ඇහුණාද? ඔයා ඇඳට වී ඉන්ට ඕන!"

පිළිතුරු වශයෙන් වැඩ බැරි දාස මුහුණ ඇඹුල් කර ගත්තා. දත් විරිත්තන්නට වුණා.

"දත් විරිත්තලා හරි යන්නෙ නැහැ. ඇඳුම් හොයන්නට මහන්සි ගන්න එපා. මම ඒවා හොඳට හංගලා තියෙනවා" නිල්මිණි එහෙම කියලා බේත් තුණ්ඩුවත් අරගෙන කාමරයෙන් පිට වී ගියා.









වැඩ බැරි දාසගේ හපන්කම් ගැන ඔබ වැඩි දුරටත් සැලකිලි දක්වයි නම්, කුසුම් පුරයේ වැසියන් ගැන දැන ගැනීමට ඔබ ආශා කරයි නම් මේ පොත් පෙළට අයත් අනික් පොත් කියවන්න:

අලුත් යාළුවෝ

වට මේස කතා


KANOL
PUBLISHING HOUSE (PVT) LTD.

www.kanolbooks.com

Rs. 400/-

071 3493447 011 2760036

facebook.com/kanol publish

kanolpublish@gmail.com

83/16/A, Hokandara East, Hokandara

ISBN 978-624-5937-77-6